**ශ්‍රී ලංකා හදබිම අධිකාරිය - 2024**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02ට අනුකූලව පිළියෙල කර නොතිබුණි. | වර්ෂය තුල මුදල් සහ මුදල් හා සමාන දෑ ගලා එම් හා ගලා යාම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 27 හා 28 ඡේදයන් අනුව ඉදිරිපත් කර ඇති බව. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව පිළියෙල කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2001 – 2010 කාලසීමාවට අදාළව සමාලෝචිත වර්ෂයේ ගෙවා ඇති සේවක අර්ථසාධක අරමුදල් රු.4,213,582 ක් රඳවා ගත් ලාභයට ගැලපීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගළපා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | වියදම නිශ්චිතව එම වර්ෂ තුල හඳුනාගෙන නොමැති බවත් එම වටිනාකම් ගෙවීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවෙන් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අදාළ තීරණ ලැබී ඇති බවත්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2024 වර්ෂය තුල ගෙන ඇති අතර වියදමක් ලෙස 2024 වර්ෂය තුල සටහන් කළ බව. | ඉදිරි වර්ෂවලදී කාලානුරූපීව වියදම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර තැන්පතු පොළී ආදායම හා ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම, | 2024 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී ස්ථාවර තැන්පතු පොළී ආදායම සහ ලැබිය යුතු | නොසැසඳීම් පරීක්ෂා කර නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවලට |

| | | | |
|---|---|---|---|
| | විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව සිදුකළ ගණනය කිරීමෙන් ලබා ගත් අගයන් සමඟ සැසඳීමේදී පිළිවෙලින් රු.2,829,425 ක හා රු.3,899,814 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | ස්ථාවර තැන්පතු පොලී ආදායම ලෙස තැන්පතු කාල සීමාව පමණක් ගෙන ගණනය කිරීම් සිදුකිරීම හා වර්ෂය සඳහා බෙදා හැරීම ගණනය කිරීම මගහැරී ඇති බව. | ගැලපිය යුතුය. |
| (ඇ) | 2024 ජනවාරි මාසයේ ලබාගෙන තිබුණු රජයේ තක්සේරු වාර්තාව අනුව, ගොඩනැගිලි වටිනාකම රු.95,155,000ක් වුවද, මූල්‍ය ප්‍රකාශනයේ ගොඩනැගිලි වටිනාකම රු.43,330,620 ක් ලෙස දක්වා තිබීමෙන් රු.51,824,380 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | 2024 වර්ෂයේ ගොඩනැගිලි තක්සේරු වටිනාකම් ලබා ගෙන ඇති අතර, ඒ පිළිබඳව අභ්‍යන්තර දැනුම්දීමක් සිදු නොවීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා ඇති බව. | - එම - |
| (ඈ) | අධිකාරිය විසින් මධ්‍යම ඉංජිනේරු සේවා සමාගම (CESL) සමඟ සිදු කරනු ලබන ව්‍යාපෘතිය යටතේ ඇති පල්ලේකැලේ ගොවිපලේ 2024 අප්‍රේල් 02 දින ඉදිකරන ලද පිරිවැය රු.26,853,829 ක්වූ කුකුල් නිවස්නවලට අදාල රු.502,130 ක්වූ ක්ෂය වටිනාකම ගිණුම්ගත නොකිරීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද, ක්ෂය වෙන් කිරීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද දක්වා තිබුණි. | ක්ෂය වටිනාකම නිවැරදිව ගණනය කර ඇති අතර එය Excel sheet තුල මුළු එකතුව ගැනීමේදී එම තීරුව එකතු කිරීම මග හැරී ඇති බව. | නිවැරදිව ගණනය කිරීම් සිදුකළ යුතුය. |
| (ඉ) | මධ්‍යම ඉංජිනේරු සේවා සමාගම (CESL) සමඟ සිදු කරනු ලබන ව්‍යාපෘතියේ සමාගමේ දායකත්වය මත සිදුකරන කාර්යන්හි සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති රු.15,935,828 ක කෙරීගෙන යන වැඩ වටිනාකම අධිකාරියේ වත්කම් ලෙස හා සමාගමට අදාළ බැදීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | ගොඩනැගිලි සඳහා පමණක් වත්කම් ලෙස හඳුනා ගන්නා අතර එහි පවතින කෙරීගෙන යන වැඩ වටිනාකම් නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | කෙරීගෙන යන වැඩ ගිණුම්වල හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ CESL ව්‍යාපෘතියේ ලාභය රු.3,557,543 ක් වූ අතර, හඳබිම අධිකාරිය හා CESL ව්‍යාපෘතිය අතර ඇති අවබෝධතා ගිවිසුම අනුව ඉදිරියේදී තීරණය තරනු ලබන කිසියම් පදනමකට අනුව ප්‍රතිශතාත්මකව ලාභය බෙදාහැරිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා කිසිඳු වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. | CESL ව්‍යාපෘතියට අදාලව නීතිපති දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති ප්‍රධාන ගිවිසුම 2025 වර්ෂයේ අප්‍රේල් මස අත්සන් තබන ලදී. 2025 වර්ෂය තුල ප්‍රධාන ගිවිසුම ප්‍රකාරව හා එම අනුමැතින් ප්‍රකාරව ලාභය සඳහා වෙන් කිරීමට අවශ්‍ය කටයුතු කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි වටිනාකම් හඳුනාගත යුතුය. |
| (උ) | සමාගම් 3 ක් විසින් අධිකාරිය සමඟ 2024 ජනවාරි 05 දින ඇතිකරගත් බඩ ඉරිඟු ආනයන | නිරීක්ෂණය පිළිගන්නා බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන |

| | | | |
|---|---|---|---|
| | ගිවිසුමට අනුව පරිපාලන හා මෙහෙයුම් ගාස්තු ලෙස රු.15,250,000 ක මුදලක් 2024 ජනවාරි 08 වන දින අධිකාරියේ තැන්පත් කර තිබුණි. එහෙත් එම වටිනාකම 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ බඩ ඉරිගු ව්‍යාපෘතියේ ආදායම් ලෙස හඳුනාගෙන, ලැබිය යුතු ආදායම ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම අඩුවෙන් දක්වා තිබුණි. | | ගිණුම්ගත වන බව තහවුරු වන අභ්‍යන්තර පාලන ක්‍රමවේද හඳුන්වා දිය යුතුය. |
| (ඍ) | 2024 වර්ෂය තුළ බඩ ඉරිගු ආනයනය කිරීමට අධිකාරියට හිමිව තිබූ කෝටාව භාවිතා කර අධිකාරිය විසින් සමාගම්වලින් ලබාගත් පරිපාලන හා මෙහෙයුම් ගාස්තුවලින් ඊට අදාළ වියදම් අඩුකළ පසු ශුද්ධ ආදායම රු.102,499,264 ක් විය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශන තුළ එම ආදායම රු.117,371,077 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.14,871,813 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | ලැබීම හා ගෙවීම් යන දෙකම එකම ගිණුම තුළ ගිණුම තැබීම් සිදුකිරීමෙන් ආදායම වැඩියෙන් පෙන්නුම් කිරීමක් සිදු වී ඇති බව. | නොසැසඳීම ගලපා ගිණුම් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | නියැදියක් පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි උපචිත වියදම් රු.287,838 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ ආදායම වැඩියෙන්ද වගකීම් අඩුවෙන්ද දක්වා තිබුණි. | 2024 වර්ෂය තුළ උපචිත වියදම් ගණනය කිරීම 2025 ජනවාරි 31 දිනෙන් අවසන් කරන ලද අතර ඊට පසු ඉදිරිපත් කරන ලද වියදම් ගණනය කිරීම සිදු නොකරන බව. | ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව කටයුතු කර නිසි පරිදි ගලපා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය. |
| (ඒ) | අධිකාරිය සතු බැංකු ඉතුරුම් ගිණුමක 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය, බැංකු තහවුරු කිරීම් අනුව රු.4,041,152 ක් ද මූල්‍ය ප්‍රකාශනය අනුව රු.5,558,648 ක් හා මුදල් පොත අනුව රු.4,605,330 ක් ද වූයෙන් ශේෂයේ නොසැසඳීමක් නිරීක්ෂණය වූ අතර, එම වෙනස නිරවුල් කිරීමට විගණිත දිනය වූ 2025 මැයි 05 වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පෙර වර්ෂයන්වල සිට පෙන්වන වෙනස සොයා බලා නිවැරදි කිරීමට 2025 වර්ෂයේ කටයුතු කරන බව. | විධිමත් පරීක්ෂණයක් පවත්වා නොසැසඳීමට හේතු අනාවරණය කරගෙන නිසි අනුමැතිය යටතේ ගැලපීම් කළ යුතුය. |
| (ඔ) | මධ්‍යම ඉංජිනේරු සේවා සමාගම (CESL) සමඟ ක්‍රියාත්මක ව්‍යාපෘතියේ ගෙවීම් ලේඛනයේ විදුලිය හා ජලය වැය ශීර්ෂ යටතේ කිසිදු වියදමක් මාසිකව සටහන් කර නොතිබූ අතර, විධිමත් පදනමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානයේදී ජර්නල් සටහන් මගින් ව්‍යාපෘතියේ විදුලි වියදම රු.1,711,775 ක්ද, ජල වියදම රු.80,250 ක්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද, පල්ලේකැලේ ගොවිපලේ සහ CESL ව්‍යාපෘතියේ ආදායම වෙන් වෙන්ව මාසිකව හඳුනා ගැනීමට විධිමත් පදනමක් සකසා ගැනීමෙන් තොරව වර්ෂය අවසානයේදී ජර්නල් | ප්‍රාථමික පිරිවැය විභජනය කර ඇත්තේ ආදායමට සමානුපාතිකව වන අතර ව්‍යාපෘතිය තුළින් විකුණුම් සඳහා නිකුත් කරන ලද බිල්පත්හි ආදායම් ප්‍රධාන කාර්යාලය වෙත ගිණුම්ගත කර ඇති මූලාශ්‍ර ලේඛණ, උපයෝගී ලේඛණ හා වාර්තා අනුව සංසන්දනය කර සටහන් කර ඇති බව. | ව්‍යාපෘතියේ ආදායම් හා වියදම් වෙන් කර හඳුනා ගැනීමේ පදනමක් ස්ථාපිත කළ යුතු අතර, අදාළ අගයන් සනාථ කිරීමට සාක්ෂි විගණනයට ලබා දීමට ද කටයුතු කළ යුතුය. |

සටහනක් මගින් ව්‍යාපෘතියේ ආදායම ලෙස රු.26,996,814 ක් ගිණුම්ගත කර තිබුණි.

### 1.5.3 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂය | මූල්‍ය ප්‍රකාශනය අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ස්ථාවර තැන්පතු වටිනාකම | 108,184,532 | 109,257,787 | 1,073,255 | වටිනාකම සඳහා මුල් ආයෝජන වටිනාකම ගෙන ඇති අතර එම ආයෝජන කල් පිරීමේදී පොළිය සමඟ අලුත් වූ වටිනාකම් සමඟ අගය සටහන් කිරීම මඟහැරී ඇති බව. | නොසැසඳීම හඳුනාගෙන ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි වටිනාකම ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වායු රයිෆල් සහ විදුලි වැට ලබාදීම වෙනුවෙන් වියදම | 13,047,297 | 19,997,683 | 6,950,386 | 2024-12-31 තුල පවතින තොග වටිනාකම් තොග ගිණුම හර කර අදාළ වැය ශීර්ෂයෙහි වියදම් ගිණුම් බැර කිරීම හේතුවෙන් වියදම අඩු වී ඇති බව. | - එම - |
| (ඇ) | පල්ලේකැලේ ගොවිපලේ විකුණුම් ආදායම | 36,545,788 | 18,742,845 | 17,802,943 | මුදල් පොතට අනුව පල්ලේකැලේ ගොවිපල තුල විකුණුම් ආදායම ගිණුම් ගත කර ඇති අතර ගොවිපලේ ආදායම් ලේඛණය අනුව ගිණුම් ගත කර නොමැති බව. | නොසැසඳීමට හේතු සොයා නිවැරදි ගොවිපල ආදායම් ලේඛන නිවැරදිව පවත්වා නොගැනීම සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතු අතර, ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යාමට උපදෙස් ලබා දිය යුතුය. |
| (ඈ) | මධ්‍යම ඉංජිනේරු සේවා | 26,996,815 | 4,695,223 | 22,301,592 | මුදල් පොතට අනුව CESL ව්‍යාපෘතිය තුල විකුණුම් | - එම - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | සමාගම (CESL) සමඟ ක්‍රියාත්මක ව්‍යාපෘතියේ විකුණුම් ආදායම | | | | ආදායම ගිණුම් ගත කර ඇති අතර CESL ව්‍යාපෘතිය ආදායම් ලේඛණය අනුව ගිණුම් ගත කර නොමැති බව . | |
| (ඉ) | කොත්මලේ ගොවිපලේ විකුණුම් ආදායම | 21,048,896 | 1,091,448 | 19,957,448 | මුදල් පොතට අනුව කොත්මලේ ගොවිපල තුල විකුණුම් ආදායම් ගිණුම් ගත කර ඇති අතර ගොවිපලේ ආදායම් ලේඛණය අනුව ගිණුම් ගත කර නොමැති බව. | - එම - |
| (ඊ) | CESL ව්‍යාපෘතියේ දෛනික කම්කරු වැටුප | 2,948,535 | 2,693,307 | 255,228 | ජනවාරි මසට අදාල දෛනික කම්කරු වැටුප CESL ව්‍යාපෘතියේ ගෙවීම් ලේඛණය තුල සටහන් නොවී පල්ලේකැලේ ගොවිපලෙහි ගෙවීම් ලේඛණය තුල සටහන් කර ඇති බව. | නොසැසඳීමට හේතු සොයා නිවැරදි කිරීමටත් ලේඛන විධිමත්ව හා නිවැරදිව පවත්වා ගෙන යාමට අභ්‍යන්තර වැඩපිළිවෙලක් හඳුන්වා දීමත් කළ යුතුය. |
| (උ) | CESL ව්‍යාපෘතියට අදාළ මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික ආයතනයෙන් යොදා ඇති වත්කම්වල වටිනාකම | 88,067,247 | 87,386,371 | 680,876 | CESL ආයතනය මගින් කිසිදු ශේෂ සනාථයක් ලබා ගෙන වත්කම් වටිනාකම් ගිණුම් තැබීම් සිදු නොකළ බව. | CESL ආයතනයේ පොත්පත්, අධිකාරියේ පොත්පත් හා වාර්තා එකිනෙක සසඳා නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට පියවර ගත යුතුය. |

## 1.6 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ හදබිම සමුපකාර සමිතියෙන් ලැබිය යුතු රු.1,262,400 ක කුලී ආදායම දිගුකාලීන වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | කාලච්ඡේද සඳහා වෙන්කර ගිණුම් තැබීමේදී සිදුවන ලද සටහන් කිරීමේ දෝෂයක් බව. | රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අනුව කටයුතු කර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නිවැරදි කළ යුතුය. |

## 1.7 නීති, රීති හා රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති / විධානයට යොමුව | විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 110 | වාහන අනතුරු, වගාබිම්වල සිදුවන හානි හා සතුන් මිය යාම වැනි හානි හා පාඩු සටහන් කිරීමට හානි හා පාඩු ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | අධිකාරියේ ගොවිපල් හි සතුන් හා වගාබිම් හි හානි පාඩු සටහන් ලේඛණයක් නඩත්තුවන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි හා පාඩු ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ii) | මු.රෙ. 137 හා 138 | වවුචර් අනුමත කරන සහ සහතික කරන නිලධාරීන් විසින් මු.රෙ. වගන්තිවලින් බැහැරව ගෙවීම් අනුමත කර චෙක්පත් ලියා අත රඳවා ගෙන තිබීම හේතුවෙන් වායු රයිෆල් 150 ක් මිලදී ගැනීම සඳහා 2023 දෙසැම්බර් 28 දින සැපයුම්කරු නමින් ලියන ලද රු.3,727,500 ක් වටිනා චෙක්පත සැපයුම්කරු වෙත 2024 අප්‍රේල් 30 දින නිකුත් කර තිබුණි. තවද, කාර්යයක් ඉටු කිරීමෙන් තොරව ගෙවීම් කිරීමට වවුචර් සකස් කර අනුමත කිරීම නිසා 2024 දෙසැම්බර් 31 දින ලියන ලද | භාණ්ඩ සඳහා චෙක්පත් ලියා වෙන් කළද සැපයුම්කරුවන් භාණ්ඩ සපයා නිසි පරිදි තාක්ෂණික ඇගයීම් කමිටුව පරීක්ෂා කරන තෙක් උක්ත චෙක්පත් රදවා ගන්නා ලදී. ඉදිරියේදී මෙවැනි සිදුවීම් වළක්වා ගැනීමට කටයුතු කරන බව. | විධිමත් පරීක්ෂාවක් කර මුදල් රෙගුලාසිවලට පටහැනිව කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීමටත්, ඉදිරියේදී මෙම තත්ත්වය වළක්වා ගැනීමට වැඩපිළිවෙලක් යෙදීමටත් කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රු.8,561,213 ක චෙක්පත් 08 ක් විගණිත 2025 මැයි 05 දින වන විටත් ආදායකයන් වෙත නිකුත් නොකර අධිකාරියේ රඳවා ගෙන තිබුණි. | | |
| (iii) | මුදල් රෙගුලාසි 396 | ජංගම ගිණුම් දෙකකට අදාළව 2024 දෙසැම්බර් මස සකස් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශනය තුළ මාස 06 සිට 17 දක්වා කාලයක සිට නිකුත් කරන ලද නමුත් 2025 මැයි 05 දක්වා ගෙවීමට ඉදිරිපත් නොවූ එකතුව රු.2,117,323 ක් වටිනා චෙක්පත් 48 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ආදයකයින්ට සිහිකැඳවීම් ලිපි යැවීමට කටයුතු කරන බව. 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් නොවී තිබුණු චෙක්පත්වලින් රු.908,908 ක් 2025.02.28 දිනට නිෂ්කාශනය වී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නිරවුල් කර ගත යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු මස 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 877 (2) (ඈ) | මුදල් වර්ෂය අවසන් වී මාස දෙකක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත්, 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දින 50 කට අධික ප්‍රමාදයකින් පසුව 2025 අප්‍රේල් මස 21 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි. | අංක 01/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍ර ලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුලත් කළ මුදල් රෙගුලාසි 877 (2) (ඈ) ප්‍රකාරව 2025 වර්ෂය තුල ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව. | ඉදිරි වර්ෂවලදී කාලීනව මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් වන බව කහවුරු වන පරිදි අභ්‍යන්තර වැඩපිළිවෙලක් සැකසිය යුතුය. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 | චක්‍රලේඛය ප්‍රකාරව මාස 12 කට වරක් ඉන්ධන දහන පරීක්ෂාව සිදුකළ යුතු වුවත්, 2024 වර්ෂය පුරා ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | 2023 වර්ෂයේදී ද වාහන දහන පරීක්ෂාවක් සිදුකර ඇති අතර, මෙම පරික්‍ෂාව 2023 වර්ෂයේ අවසානයේ සිදුකළ බැවින් 2024 වර්ෂය සඳහා නැවත පරීක්ෂාවක් සිදු නොකරන ලද බව. | චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව සිදුකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.165,438,685 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.57,991,050 ක් වූයෙන් අතිරික්තයේ රු.107,447,635 ක වර්ධනයක් විය. මෙම වර්ධනයට බඩඉරිඟු හා උඳු ආනයන ව්‍යාපෘතියෙහි ආදායම් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජූලි මස 04 වන දින ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව, දේශීය බිත්තර හා කුකුල් මස් නිෂ්පාදනය ඉහළ නැංවීම සහ මිල පාලනය කිරීම සඳහා බඩඉරිඟු ආනයනයට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අවසරය ලබා දී තිබුණ අතර එම දෙපාර්තමේන්තුවට ලද කෝටාවෙන් 2023 වර්ෂය තුල මෙට්‍රික් ටොන් 21,250 ක්ද, 2024 දී මෙට්‍රික් ටොන් 25,000 ක්ද ආනයනය කිරීමට හදබිම අධිකාරියට අවසර ලබාදී තිබුණි. එහෙත් හදබිම අධිකාරිය විසින් අධිකාරියේ මුදල් යොදවා බඩඉරිඟු ආනයනය කර සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිර්ණායක අනුව බෙදා හැරීමට කටයුතු කර නොතිබුණ අතර, ඊට පටහැනිව අධිකාරියට ලැබී තිබුණ කෝටාව යටතේ බඩඉරිඟු ආනයනය කිරීමට අධිකාරිය විසින් අභිමතය පරිදි තෝරාගත් පෞද්ගලික ආනයනකරුවන් තිදෙනෙකු හට පහසුකම් සලසා රු.130,550,000 ක කොමිස් මුදලක් ලබා ගැනීමට අධිකාරිය කටයුතු කර තිබුණි. ඒ අනුව, අධිකාරියට ලබා දී තිබුණ ආනයන බලපත්‍රය භාවිතා කර ආනයන කටයුතු සඳහා තාවකාලික එකතු කිරීමේ අගය මත බදු අංකයක් ද ලබාගෙන පෞද්ගලික ආයතන වෙතින් අධිකාරියේ බැංකු ගිණුමට මුදල් තැන්පත් කර අධිකාරියේ බැංකු ගිණුම මඟින් ආනයන වියදම් පියවා භාණ්ඩ නිශ්කාෂණය සිදුකර පෞද්ගලික ආයතන තුනට ලබා දී තිබුණි. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව කෝටාව ලබාදී ඇත්තේ සුළු පරිමාණ සත්ත්ව ආහාර නිෂ්පාදකයින් අරමුණු කර බෙදාහැරීමට වුවද, බඩඉරිඟු බෙදා හැරීම සම්බන්ධයෙන් ආයතනය ඉදිරිපත් කළ ලැයිස්තුවේ සඳහන් ගොවිපලවල් මධ්‍ය හා මහා පරිමාණයේ ඒවා බවත්, බඩඉරිඟු මෙට්‍රික් ටොන් 10,000 ක් ආනයනය කළ ආනයනකරුවෙකුගේ බෙදාහැරීම් ලැයිස්තුව පරීක්ෂා කිරීමේදී ලැයිස්තුවේ සඳහන් කිසිදු | හදබිම අධිකාරිය භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක ආයතනයක් බැවින් මෙවැනි ආනයන කටයුතු සිදුකිරීමට ප්‍රතිපාදන නොමැති බැවින් ආයතනයේ ලියාපදිංචි ආනයනකරුවන් වෙතින් අභිලාෂ කැඳවා , ගිවිසුම්ගතව අදාල ආනයන කටයුතු සිදු කර ඇති බවත් එහිදී අධිකාරිය නමින් බලපත්‍ර නිකුත් කර ඇති අතර Consignee ලෙස අධිකාරියත්, ආනයනය කර බෙදාහරින ආයතනය Notify Party ලෙසත් සඳහන් කර ඇති බව හා රේගුවෙන් භාණ්ඩ නිදහස් කිරීමට තාවකාලික වැට් ලියාපදිංචියක් ලබාගෙන ඇති බව සහ අදාල ගොවිපල සුළු හා මධ්‍ය පරිමාණ ලෙස වර්ගීකරණය හා නියාමනයට අධිකාරිය සතුව තොරතුරු නොමැති බැවින් ලැයිස්තුවේ සඳහන් ගොවිපල සඳහා තොග ලබාදී ඇති බව පමණක් තහවුරු කර ගෙන ඇති අතර එම ලේඛන ඉදිරි කටයුතු සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත | විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, දූෂණයක් හෝ අවභාවිතයක් පැවතිය හැකි තත්ත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීමට නීතිය බලාත්මක කරන ආයතනයකට වාර්තා කිරීමත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගොවිපලක් වෙත අදාළ ආනයනික සමාගමෙන් බඩඉරිඟු ලබා දී නොතිබුණ බවත්, 2024 ඔක්තෝබර් 23 දින සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | ලබාදී ඇති බව. | |
| (ආ) | 2024 සිංහල හා හින්දු අලුත් අවුරුදු සමය වෙනුවෙන් වතුකරයේ ද්‍රවිඩ ජනතාවට අවශ්‍ය උඳු ඇට මෙට්‍රික්ටොන් 500 ක් ආනයනය කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් හදබිම අධිකාරිය වෙත අවසර ලබා දී තිබුණි. හදබිම අධිකාරිය විසින් අධිකාරියේ මුදලින් උඳු ඇට ආනයනය කර නොතිබුණ අතර, ලැබී තිබුණ අවසරය උපයෝගී කර ගෙන සියලුම ආනයනික ලේඛනවල හදබිම අධිකාරියේ නම සඳහන් කරමින් තොරාගත් පෞද්ගලික ආයතනයක මුදල් උපයෝගී කර ගෙන භාණ්ඩ ආනයනය සිදු කර, භාණ්ඩ එම ආයතනයට ලබා දී අධිකාරිය විසින් රු.8,000,000 ක කොමිස් මුදලක් ලබා ගෙන තිබුණි. කැබිනට් අනුමැතිය ලබා දී තිබුණේ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් අවශ්‍ය උඳු මෙරටට ආනයනය කිරීමට වන නමුත් තොග ලංකාවට ළඟාවීම ආසන්න වශයෙන් 2024 අප්‍රේල් 30 දින විය හැකි බවට ශාක නිරෝධායන සේවයේ ඉල්ලුම්පතේ සඳහන් කර තිබුණි. ඒ අනුව සිංහල හා හින්දු උත්සව සමයේ අවශ්‍යතාවය සඳහා උඳු ඇට ආනයනයට කැබිනට් මණ්ඩල අනුමැතියක් ලබා දී තිබුණ ද, අරමුණට පටහැනිව අවුරුදු සමය අවසන් වී 2024 අප්‍රේල් 30 දින සිට 2024 මැයි 03 දින දක්වා කාලසීමාව තුල උඳු ඇට ගුදම්වලින් නිදහස් කර පිටකොටුවේ තොග අලෙවිකරුවන් වෙත අදාළ පෞද්ගලික ආයතනය විසින් ප්‍රවාහනය කර තිබුණ බව නිරීක්ෂණය විය. | අධිකාරිය සතුව ප්‍රතිපාදන නොමැති බැවින් ලියාපදිංචි ආනයනකරුවන්ගෙන් අභිලාශ කැඳවා ආනයන කටයුතු සිදු කර ඇති අතර මෙම ආනයන කටයුත්තට අනුමැතිය ලැබුනේ 2024.04.03 දින බැවින් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීමට හා ආනයන කටයුතු සඳහා පැවතුනේ දින 09 කි. කැබිනට් අනුමැතිය අනුව අධිකාරිය වෙත උපදෙස් ලබා දී තිබුනේ ආනයනය සඳහා පමණක් වන අතර බෙදාහැරීම් සඳහා උපදෙස් ලබා දී නොතිබුණි.ඒ අනුව අදාල තොග ආනයන කරු විසින් රඳවා නොගැනීම පිණිස ආනයනික තොග වෙළඳපොළට ඉදිරිපත් කරන ලෙස අධිකාරිය මගින් අත්සන් තබන ගිවිසුම මගින් දැනුම් දී ඇති බව. | - එම - |
| (ඇ) | වායු රයිෆල් මිළදී ගැනීමේ ව්‍යාපෘතියේ ලංසු ලේඛන අනුව තෝරාගත් සැපයුම්කරු සමඟ එකඟ වී ඇති බෙදාහැරීම් කාලය දින 25 ක් වන නමුත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ වායු රයිෆල් 150 ක් සඳහා වූ විශේෂ ව්‍යාපෘතියේ වායු රයිෆල් සැපයීමට මාස 04 කට අධික කාලයක් ගතවී තිබුණි. එසේම මේ සම්බන්ධයෙන් අයකරන ප්‍රමාද ගාස්තු සම්බන්ධයෙන් කිසිඳු සටහනක් ලංසු කොන්දේසිවල සඳහන් කර නොතිබුණෙන් ප්‍රමාදය සම්බන්ධයෙන් සැපයුම්කරුට එරෙහිව ක්‍රියාමාර්ගයක් ගත නොහැකි වී තිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලැබෙන තෙක් චෙක්පත් නිකුත් කිරීමක් සිදු නොකළ බව හා කාර්යසාධන සුරක්ෂණය රදවා ගත් බව. | ඉදිරියේදී ලංසු ලේඛන සැකසීමේදී අඩුපාඩු වළක්වා ගැනීමටත්, සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී යෝග්‍ය සැපයුම්කරුවෙකු ලැබෙන පරිදි නිර්ණායක තවදුරටත් පුළුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගබඩා ලේඛනය අනුව 2025 අප්‍රේල් 07 දිනට වායු රයිෆල් ශේෂය 10 ක් වුවත්, භෞතික පරීක්ෂාවට අනුව ශේෂය 03 ක් වූයෙන්, වායු රයිෆල් 07 ක | රයිෆල් 07 ට අදාල 50% දායකත්වය ලබා දී තිබූ ප්‍රතිලාභින් වෙත සෘජුව | වායු රයිෆල් 7 බෙදීමට අදාල ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ |

| | | | |
|---|---|---|---|
| | ඌණතාවයක් පැවතුණි. | අදාළ වායු රයිෆල් ලබා දී ඇති බව. | යුතුය. |
| (ඉ) | සංශෝධිත අයවැය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණේ සමාලෝචිත වර්ෂය අවසාන වී 2025 ජනවාරි 10 පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී වූයෙන්, සත්‍ය වියදම අනුව සංශෝධිත අයවැය සකස් කර අයවැය විචලනයක් සිදු වී නොමැති බව පෙන්වාදීමට කටයුතු කර තිබුණි. | 2024 වර්ෂයේ දෙසැම්බර් මසට අදාල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම ජනවාරි මස පැවතුනු අතර, 2024 වර්ෂය ආරම්භයේ වෙන් කරන ලද අයවැය සීමාව ඉක්මවා නොයන අතර, වැය විෂයන් අතර පමණක් වියදම් සීමා සංශෝධනය කර ඇති බව. | ඉදිරියේදී කාලීනව අයවැය ලේඛනය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | අධිකාරිය විසින් සේවක පඩිනඩි හා සංවර්ධන ව්‍යාපෘති සඳහා සම්පූර්ණයෙන්ම රජයේ මූලධන හා පුනරාවර්තන ප්‍රදාන උපයෝගී කරගන්නා අතර, 2024 වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන ලෙස රු.149,655,800 ක් හා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.220,000,000 ක් ලැබී තිබුණි. අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ බඩඉරිඟු හා උඳු ආනයනය කිරීමේ ව්‍යාපෘති තුළින් කොමිස් වශයෙන් රු.138,550,000 ක ආදායම් උපයාගෙන තිබුණ ද, ඒ පිළිබඳ සලකා බලා මහා භාණ්ඩාගාරයෙන් අධිකාරිය සඳහා ලබාදෙන ප්‍රදාන අඩුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධිකාරියේ සංවර්ධන හා පුනරාවර්තන වියදම සඳහා වාර්ෂිකව ලබා දෙන අරමුදල් ප්‍රශස්ත ලෙස අදාල අරමුණු ඉටු කර ගැනිම සඳහා භාවිතා කර ඇති අතර අධිකාරියේ ගොවිපළ සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන වෙන් නොකරන බැවින් ගොවිපළේ කටයුතු ඵලදායිව ඉටු කිරිමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව අරමුදල් භාවිතා කර ඇත. ඉතිරි අරමුල් වෙලඳපළේ පවතින ඉහල පොලී අනුපාත මිල ගනන් යටතේ වානිජ බැංකු වල ආයොජනය කර ඇති බව. | අධිකාරියේ ආදායම විශ්ලේෂණය කර ඒ අනුව භාණ්ඩාගාරයෙන් ලබා ගන්නා ප්‍රතිපාදන අඩු කර ගැනීමට පියවර ගත යුතුය. |
| (උ) | රාජ්‍ය ආයතනයක් ලෙස වාර්ෂික අනුමත අයවැය සීමාවන් තුළ ආයතනයේ කටයුතු මෙහෙයවා ගත යුතු වුවද, උඳු සහ බඩඉරිඟු ආනයනකරුවන්ගෙන් ලබා ගන්නා රු.138,550,000 ක කොමිස් මුදලින් අධිකාරිය විසින් නිලධාරීන්ගේ ණය ගෙවීම සඳහා වන චක්‍රීය ණය අරමුදලට රු.8,000,000 ක් හා නිලධාරීන්ට ටැබ් පරිගණක මිලදී ගැනීම සඳහා රු.5,799,936 ක මුදලක්ද වාර්ෂික අනුමත අයවැය සීමාවන් ඉක්මවා වැයකර තිබුණි. | ටැබ් පරිගනක මිලට ගැනිමට බඩඉරිඟු අරමුදලේ මුදල් වියදම් කල බව හා රාජ්‍ය නිලධාරීන්ට වාර්ෂිකව ණය ලබා දීමට අග්‍රිම වෙන් කලද අප අධිකාරිය වැනි ව්‍යස්ථාපිත ආයතන සඳහා වාර්ෂික අරමුදල් වෙන් කර නොමැති බැවින් අභ්‍යන්තරව පිහිටවා ඇති චක්‍රිය අරමුදලක් මගින් ණය | අයවැය අනුමැතීන්ට පරිබාහිරව වැය කිරීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් කර අදාල පරිදි පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ගෙවීම සිදුකරන අතර ඒ සඳහා අවශ්‍ය සීමා හා කොන්දේසි සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව අදාල ණය ලබා දිම සිදුකරනු ලබන බව. | |
| (ඌ) | අධිකාරියේ අළෙවි අංශයේ 2015 වර්ෂයේ සිදුවූ මූල්‍ය වංචාවකට අදාළව රු.2,129,759 ක අලාභයක් හඳුනාගෙන තිබුණ අතර, අලාභය සිදුවී වර්ෂ 10 ක් ගතවී ඇතත්, විගණිත 2025 මැයි 05 වන දින වන විටත් රු.575,000 ක් පමණක් අයකර ගෙන තිබුණ අතර, තවදුරටත් අයකර ගත යුතු ශේෂය රු.1,554,759 ක් අයකර ගැනීමට හදබිම අධිකාරිය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අයකිරීම සම්බන්ධයෙන් පරික්ෂා කර බලා නිර්දේශ වාර්තාවක් ලබා ගැනීමට කමිටුවක් පත් කර ඇති අතර, අදාල නිර්දේශ වාර්තාව ලද පසු ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. | අලාභ අයකර ගැනීමට කාලීනව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, අයකර ගත යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (එ) | සී/ස හදබිම සමුපකාර සමිතිය යන නමින් සමුපකාර සමිතියක් පිහිටුවා හදබිම අධිකාරිය යටතේ ක්‍රියාත්මක වූ අලෙවි ව්‍යාපෘතියේ කටයුතු එම සමිතියට පවරා තිබූ නමුත් සමුපකාර සමිතියක් පිහිටුවීමෙන් අපේක්ෂිත අරමුණු කිසිවක් ඉටු වී නොතිබුණ අතර, සමුපකාර සමිතිය හදබිම අධිකාරියට ලැබිය යුතු බදු කුලී ආදායම හා අනෙකුත් ගාස්තු අය නොවී පැවතුණි. එසේම හදබිම අධිකාරිය හා සමුපකාර සමිතිය අතර පවතින අවබෝධතා ගිවිසුමද 2024 ජනවාරි මස 22 දින වන විටත් අවසන් වී තිබුණි. සමුපකාර සමිතිය පිහිටුවීම සම්බන්ධයෙන් නඩු කටයුත්තක් පවතින අතර, විගණිත දින වන 2025 මැයි 05 දින දක්වාත් එය අවසන් වී නොතිබීම හේතුවෙන් අදාළ දේපළ මගින් හදබිම අධිකාරියට අයකර ගත හැකිව තිබූ ආදායමද අය වී නොතිබුණි. | අදාළ සමුපකාර සමිතියේ පැවති අක්‍රමිකතා හේතුවෙන් එහි අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී ඇති බව හා ගිවිසුම ආරම්භ කළ මුල් අවස්ථා වේදීම ගිවිසුම් කඩවී ඇති අතර ඒ සම්බන්ධ ගිවිසුමෙන් ඉවත්වීමට හෝ ගිවිසුම් කඩකිරීම මත නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොමැති අතර, මේ වන විට මහනුවර දිසා අධිකරණයේ මේ සම්බන්ධ නඩු කිහිපයක් විභාග වෙමින් පවතින බව. | පැවති අවබෝධතා ගිවිසුම් හා නීතිමය තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක් කර අපේක්ෂිත අරමුණු බටු කර ගැනීමටත්, අධිකාරිය වෙත ආදායම් ලබා ගැනීමටත් කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ කාර්යභාරය ඉටුකිරීම යටතේ වැල් දොඩම් වගාවන්ට බිංදු වාරි පද්ධතියන් ස්ථාපිත කිරීමට 2023 වර්ෂයේ දී රු.14,927,920 ක් වැය කර පද්ධති 70 ක් මිල දී ගෙන ගොවීන් වෙත බෙදාහැර තිබුණ ද, පැළ සිටුවා තිබූ වගාබිම් තුනකට බිංදු වාරි පද්ධති සවිකර නොතිබුණු අතර, අගුණකොළ පැලැස්ස ගුරුවෙල ප්‍රදේශයේ වැල්දොඩම් වගාකරන ගොවීන් සිව්දෙනෙකුම විවිධ හේතූන් දක්වමින් බිංදු වාරි පද්ධති භාවිතා කිරීම 2024 වර්ෂයේ දී අත්හැර | ප්‍රතිලාභින්ට බිංදුවාරි පද්ධති ලබාදී මසකට පසු විගණන කටයුතු සිදු කර ඇති අතර මේ වන විට එම ප්‍රතිලාභීන් බිංදුවාරි පද්ධති සවිකර භාවිතා කරන බව, භාවිතා නොකරන්නේ නම් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරන බව. | අධීක්ෂණය පුළුල් කර භාවිතා නොකරන වත්කම් වෙනත් සුදුසු පාර්ශ්ව වෙත ලබා දීමට පියවර ගත යුතු අතර, විධිමත් අධ්‍යයනයක් සිදු කර ව්‍යාපෘති හඳුනා ගැනීම හා ප්‍රතිලාභීන් හඳුනා ගැනීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දමා තිබුණ බැවින්, ඒ සඳහා දරා ඇති වියදම් නිෂ්කාර්ය වී තිබුණි. | | |
| (ආ) | ගම්කුකුළු පාලනය වර්ධනය කිරීමේ අරමුණින් අධිකාරිය විසින් ගොවීන් වෙත කුකුළු පැටවුන් බෙදා දී තිබුණ අතර, එහිදී කුකුළු පැටවුන් 10 ක් ලබාදීමේ දී පිරිමි පැටවුන් 02 ක් හා ගැහැණු සතුන් 08 ක් වන ලෙස අනුපාතිකව බෙදා දුන් බව පැවසුවද, ඇතැම් ගොවීන්ට ලබා දුන් පිරිමි සතුන් ප්‍රමාණය සියයට 46 ක් වී තිබුණු අවස්ථා විය. ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී කුකුළු පැටවුන් ලබා දීමට ලංසුකරුගේ හැකියාව සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර නොතිබීම හේතුවෙන් ගම්කුකුළු පැටවුන් බෝ කිරීමේ ගොවිපළක් නොමැති ගොවිපළකින් පැටවුන් 8615 ක් මිලදී ගෙන තිබුණි. සැපයුම්කරු විසින් විවිධ ගොවිපලවලින් ලබාගත් ගම්කුකුළු පැටවුන් අධිකාරියට සපයා තිබුණු අතර, සැපයූ ගම්කුකුලන්ගෙන් රු.1,033,600 ක් වටිනා පැටවුන් මිය යෑම නිසා මුදල් ගෙවීම ද අත්හිටුවා තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණ බව විගණනයට නිරීක්ෂණය විය. | කුකුළු පැටවුන්ගේ ලිංග නිර්ණය කිරීම කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් බාහිර ආයතනයක් හරහා සිදුකරන අතර නිශ්චිතව නිර්ණය කිරීමේ අපහසුතාවය හේතුවෙන් මෙම ගැටලුව මතු වී ඇති බව.<br>අධිකාරිය විසින් බෙදා දුන් කුකුල් පැටවුන් මිය ගියේනම් ඊට අදාල ගෙවීම් අත්හිටුවීමට කටයුතු සිදුකර කර ඇති බවත්, ඒ සඳහා සතුන් ලබාදීම 2025 ජනවාරි සිදු කිරීමට අපේක්ෂිත බව. | ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදුකර අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වීමට අදාල නිලධාරීන් සම්බන්ධ පියවර ගත යුතුය. |
| (ඇ) | අධිකාරියට හම්බන්තොට ප්‍රදේශයේ ගොවිපළකින් වැල් දොඩම් පැළ 4000 ක්, රඹුටන් පැළ 40 ක් බද්ධ දූරියන් පැළ 2250 ක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන තීරණ ලබාදී තිබුණද, 2024 ඔක්තෝබර් 09 දින විගණනය විසින් සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී සැපයුම්කාර ගොවිපලේ වැල්දොඩම් පැළ පමණක් තිබුණු අතර, බද්ධ දූරියන්, රඹුටන් පැළ නොතිබුණි. ඒ අනුව, ප්‍රසම්පාදන තීරණ ලබාදීමේ දී සැපයුම්කරු සතුව ඉල්ලුම් කරන පැළ වර්ග පවතීද, එම පැළ හොඳ තත්ත්වයේ ඒවාද, ඉල්ලුම් කරන ප්‍රමාණය සැපයිය හැකිද යන්න පිළිබඳ සලකා බලා නොතිබුණි. | ප්‍රායෝගික තත්ත්වයක් නිසා අදාල පැළ තවාන් පරික්ෂා කිරීමට නොහැකි වූ නමුත් ඉදිරියේදී එවැනි කටයුතු සිදු නොවීමට වග බලා ගන්නා බව. | විධිමත් පරීක්ෂණයක් පවත්වා අවිධිමත් පරිදි ප්‍රසම්පාදන කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය. |
| (ඈ) | 2024 වර්ෂයේ පළතුරු ගම්මාන වැඩසටහන සඳහා දරන ලද මුළු වියදම රු.29,706,889 ක් වන අතර, මෙම වැඩසටහන ජාතික වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කල යුතු වුවද හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03ක් පමණක් පදනම් කරගෙන ද්‍රව්‍ය මිලදී ගැනීම සිදු කර එම මිල ගණන් මත ලබාගත් රු.3,543,100 ක් වටිනා ද්‍රව්‍ය ගම්පහ, කුරුණෑගල හා අනුරාධපුර දිස්ත්‍රික්කවල හඳුනාගත් ප්‍රතිලාභී වෙත බෙදාහැර තිබුණි. පැල මිලදී ගෙන මාස 3ක් යාමට ප්‍රථම හඳුනාගත නොහැකි රෝගී තත්වයක් මත වගාවන්ට හානි සිදුවී තිබූ අතර හොරණ පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් මේ පිලිබඳව පරීක්ෂණයක් | පිළිතුරු ලබා දී නැත | විධිමත් පරීක්ෂාවක් සිදු කර ව්‍යාපෘතියේ දුර්වලතා සඳහා වගකිවයුතු පාර්ශ්ව හඳුනාගෙන අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. |

සිදුකර  මාස 06ක් පමණ ගතවී ඇතත් විගණිත 2025 ජුලි 08 දින වන විටත් අවසන් වාර්තාවක් නිකුත් කර නොතිබුණි.

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජලමූලාශ්‍ර හා දියකඳුරු සංරක්ෂණ ව්‍යාපෘතිය යටතේ රු.970,000 ක ගිවිසුම්ගත මුදලකට බිබුලගොඩහේන බිබුල - යහමුල්ල ජලමූලාශ්‍රය පදනම් කරගෙන කෘෂි ඇළ මාර්ගයක් ඉදිකිරීම සඳහා 2024 ජුලි 08 දින වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රජාමූල සංවිධානයක් සමඟ ගිවිසුම්ගත වී තිබුණි. ගිවිසුමේ කොන්දේසි අංක 03 ට අනුව 2024 අගෝස්තු 08 දින වැඩ අවසන් විය යුතු වුවත්, 2024 ඔක්තෝබර් 09 දින වනවිට ගිවිසුම් කාලය අවසන් වී මාස 02 ක් ඉක්ම ගොස් ඇතත් ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම හෝ සිදු කර නොතිබුණි. | අයහපත් කාලගුණය හා කොන්ත්‍රාත්කරු හා ගොවි සංවිධානය අතර ඇති වූ මතභේද නිසා ව්‍යාපෘතිය අවලංගුකර අරමුදල් වෙනත් ව්‍යාපෘතියකට යොදවා ඇති බව. | විධිමත් පරීක්ෂණයක් පවත්වා යෝජිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු නොකළ වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගත යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තාක්ෂණ කමිටුවේ සාමාජිකයින් දෙදෙනෙකු තමන් 2023 නොවැම්බර් 21 දින කාර්යාලයේ සේවයේ යෙදී සිට තිබුණ ද, එදින තමන් අගුණුකොලපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බිංදු වාරි පද්ධති 03 ක් නිරීක්ෂණය කළ බවත්, අදාල ද්‍රව්‍ය හා උපකරණ නිසි ලෙස යොදා ගෙන එම කාර්ය නියමිත සැලැස්මට සකස් කර ඇති බවට ලබාදුන් වාර්තාවක් මත 2023 නොවැම්බර් 29 දින තාක්ෂණික ඇගයීම් කමිටුව රැස්වී රු.14,927,920 ක මුදලක් ගෙවීම් කිරීමට නිර්දේශකර තිබුණි. කෙසේ වෙතත්, මෙම වාර්තාව ලැබීමට ද ප්‍රථම මු.රෙ 137 හා 138 නියමයන්ගෙන් බැහැරව 2023 නොවැම්බර් 24 දින කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීම් සිදු කර තිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිලධාරීන්ට පැවති කාර්ය බහුලත්වය නිසා එක් සාමාජිකයකු ක්ෂේත්‍රයට ගොස් පරික්ෂාකර වට්ස්ඇප් පණිවිඩ මාධ්‍ය හරහා පරික්ෂාකර තාක්‍ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ලබා දී ඇති බව. | විධිමත් පරීක්ෂාවක් සිදු කර අවිධිමත් පරිදි කටයුතු කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගත යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ගෙන් බැහැරව අධිකාරිය විසින් ඍජු මිලදී ගැනීම් ලෙස රු.25,328,444 ක් වටිනා කෘෂි උපකරණ 2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුල සී.ස වාණිජ විවිධ නීතිගත සංස්ථාවෙන් (STC) මිලදී ගෙන තිබුණි. | කැබිනට් අනුමැතිය ලබා දීමට පෙර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මූලික මූලධර්ම කඩවී ඇති බව අධිකාරිය පිළිගන්නා බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව අධිකාරියට වාසිසහගත වන පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විදුලි පඹයා මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් 2023 නොවැම්බර් 01 දින තෝරාගත් සැපයුම්කරු අක්කර1-1.5 සඳහා ඉදිරිපත් කර තිබූ පිරිවිතරයන් හා අක්කර 2-2.5 ක් සඳහා ඉදිරිපත් කර තිබූ පිරිවිතරයන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් විමසා තිබුණු පිරිවිතරයේ අවම අවශ්‍යතා සපුරා නොතිබුණි. ඊට අදාල තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව, 2024 මාර්තු 08 දින ලබා දී තිබුණද, එම වාර්තාව ලැබීමට පෙර මුදල් රෙගුලාසි 136 ,137 හා 138 නියමයන්ගෙන් බැහැරව රු.1,095,050 ක මුදලක් ටෙන්ඩර්කරුට 2023 දෙසම්බර් 31 දින අධිකාරිය විසින් ගෙවා තිබුණි. | පිළිතුර ලබාදී නැත. | විධිමත් පරීක්ෂාවක් සිදු කර අවිධිමත්ව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගත යුතුය. |
| (ඈ) | අධිකාරිය විසින් 2023/2024 වර්ෂයන්හි අවස්ථා 07 ක දී රු.91,650,625 ක වියදමින් වායු රයිෆල් 1453 ක් ගොවීන්ට බෙදා හැරීම සඳහා මිලදී ගෙන තිබූ අතර, එයින් රු.18,999,925 ක වියදමින් වායු රයිෆල් 450 ක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 (ඈ) වගන්තිය අනුව ප්‍රසම්පාදන වටිනාකමින් සියයට 50 නැවත ඇණවුම් කිරීමේ සීමාව භාවිතා කර දින 12 ත් 90 ත් අතර කාලයක් තුළ අවස්ථා 3 ක දී පෙර තෝරාගත් සැපයුම්කරුගෙන්ම මිලදී ගෙන තිබුණි. ඒ අනුව, අවශ්‍යතාවය නිසි ලෙස හඳුනා ගැනීමෙන් තොරව ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇති බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) අනුව ගුණාත්මක ප්‍රසම්පාදන සැලැස්මකට අනුව කටයුතු කරන බව. | අවශ්‍යතාවය නිසි ලෙස හඳුනාගෙන ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු අතර, ගුණාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් නොකළ පාර්ශ්ව වෙත විධිමත් පියවර ගත යුතුය. |
| (ඉ) | 2024 වර්ෂයේ පළතුරු ගම්මාන වැඩසටහන යටතේ වැල් දොඩම් වගාව සඳහා පැළ, GI බට හා ගැල්වනයිස් කම්බි මිලදී ගැනීම සඳහා රු.20,523,861 ක් වැයකර තිබූ අතර ඉන් GI බට 5,400 ක් සඳහා රු.17,765,136 ක්ද ගැල්වනයිස් කම්බි 2,250 kg ක් සඳහා රු.1,048, 725 ක් පෞද්ගලික ආයතනයකට ගෙවීම් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලේඛනවල සාම්පල පරීක්ෂා කල යුතු බවට සඳහන්කර නොතිබුණි. භාණ්ඩ බෙදා හැරීමේ කාලය දින 30 ක් ලෙස සඳහන් කර තිබූ අතර අවම මිල ගණන් ඉදිරිපත් කල ආයතනය භාණ්ඩ බෙදා හැරීමේ කාලය දින 45 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් විශාල බැහැර වීමක් ලෙස සලකා එම ලංසුව ප්‍රතික්ෂේප කර දෙවන අවම මිල ඉදිරිපත් කළ ආයතනය වෙත ටෙන්ඩරය පිරිනමා තිබුණද, එම ආයතනය එම ඇණවුම සම්පූර්ණ කර තිබුණේද දින 76 ක ප්‍රමාදයකින් පසුව වුවද ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවට අනුව අදාල තොග 2024 දෙසැම්බර් 06 දින පරීක්ෂාකල බවත්, ඒවා පිරිවිතර හා සාම්පල සමග ගැලපෙන බැවින් ගෙවීම් කිරීමට සුදුසු බව නිර්දේශ කර තිබූ නමුත් රු 5,921,712 වටිනා ද්‍රව්‍ය තාක්ෂණික | පිළිතුරු ලබා දී නොමැත | විධිමත් පරීක්ෂණයක් පවත්වා ප්‍රසම්පාදන නියමයන්ගෙන් බැහැරව හා පරීක්ෂා කිරීමකින් තොරව ගෙවීම් සිදුකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, රජයට අලාභයක් සිදු වී ඇත්නම් ඒවා අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

ඇගයීම් කමිටු පරීක්ෂාවකින් තොරව ක්ෂේත්‍රයට මුදා හැර තිබුණි. 2024 දෙසැම්බර් 24 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව භෞතික තොග පරීක්ෂාවට තාක්ෂණික කමිටුවෙන් එක් අයෙකු පමණක් සහභාගී වී තිබුණි. මෙම ටෙන්ඩරය නිෂ්පාදන සමාගමක් වෙත ලබා දෙනු වෙනුවට අතරමැදි සමාගමකට ලබා දී තිබුණි. රු .14,214,917 කට මිලදී ගත් බට සම්මත ප්‍රමිතියෙන් (SLS) යුතු බට නොවන බව රසායනාගාර වාර්තාව අනුව තහවුරු විය. තංගල්ල, මීරිගම, අඹනේපාල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනෙහි ග්‍රාම නිලධාරි වසම් 05 ක, බෙදා දුන් GI බට හා කම්බි සියල්ල වගාවන් සඳහා භාවිත නොකර නිවාසවල ගබඩා කර තිබුණු අවස්ථා මෙන්ම කොටසක් පමණක් ක්ෂේත්‍රයේ සවිකර කොටසක් නිවාසවල අනාරක්ෂිත ලෙස ගබඩාකර තිබූ අවස්ථා ක්ෂේත්‍ර පරික්ෂාවේදී නිරීක්ෂණය වූ අතර GI බට ලබා දී සති 03ක් ගතවීමට පෙර මල බැඳීමට ලක් වූ බවද තහවුරු විය. මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිටම සැලසුම් සකස් කිරීම, ප්‍රතිලාභීන් තෝරා ගැනීම, පසු විපරම් කටයුතු නියමිත පරිදි සිදු නොකිරීම යන කරුණු මත මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට නොහැකි තිබුණි.